සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

අවසාන වාර පරීක්ෂණය 2024

ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

9 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 15 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ක්ෂුද්‍රජීවීන් මගින් නිපදවන අහිතකර විෂ ද්‍රවයක් වනුයේ,
(1) ඇෆ්ලොටොක්සින් (2) තෛලෝදක (3) ටොක්සින් (4) විෂ ධූලක

02. පිළිකා සෛල වැපදීමේ අවදානම අඩු කෙරෙන ආහාර වර්ණයකි,
(1) කහ (2) දුඹුරු (3) කළු (4) කොළ

03. වන ආවරණය ඉවත් කිරීම නිසා
(1) ජෛව විවිධත්වය සුරැකේ. (2) වර්ෂාපතනය වැඩි වේ.
(3) පරිසර උෂ්ණත්වය අඩු වේ. (4) ජල මූලාශ්‍ර සිඳීයයි.

04. ආහාර ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි බලපාන සාධකයක් නොවේ,
(1) ජනගහන වර්ධනය අඩුවීම. (2) වෙළෙඳ ගිවිසුම්
(3) ගෝලීයකරණය (4) සුපිරි වෙළෙඳසැල් ප්‍රචලිත වීම.

05. සබරගමු පළාතට ආවේණික වූ බහුල ව පවතින ආහාර වර්ග කාණ්ඩය වනුයේ,
(1) මාළු, සියඹලා, කුරුඳු (2) එනසාල්, කරාබුනැටි, කිතුල්
(3) තල්, රතුලූනු, නෙල්ලි (4) කජු, පොල්, දෙහි

06. ව්‍යාපාර සැලැස්මක තිබිය යුතු කරුණක් වන්නේ,
(1) අපේක්ෂිත ඵලය (2) ව්‍යාපාර ක්‍රමය
(3) අපේක්ෂිත විකුණුම් ඇස්තමේන්තුව (4) පුහුණු අධිකාරිය

07. ආහාර විවිධාංගීකරණයේ දී එළකිරි යොදාගෙන සිදුකරනු ලබන නිෂ්පාදනයකි,
(1) පැස්ටා (2) පාන් (3) චීස් (4) මාගරින්

08. කාර්යක්ෂමතාව අතින් ඉහළ අගයක් ගනු ලබන්නේ,
(1) LED පහන් (2) CFL පහන් (3) සූත්‍රිකා පහන් (4) ප්‍රතිදීප්ත පහන්

09. සහල් ආශ්‍රිත ව නිෂ්පාදනය කරනු ලබන ආහාරයකි,
(1) හබල පෙති කැඳ (2) පැස්ටා (3) තෝසේ (4) වඩේ

10. ආමාශයික ප්‍රදාහය හෙවත් ගැස්ට්‍රයිටීස් රෝගය සඳහා හෙළ ඔසුවක් ලෙස සැලකිය හැකි ආහාරයකි,
(1) කොළකැඳ (2) දියබත් (3) අග්ගලා (4) එළවළු සුප්

11. විසිතුරු පැළවල මූල මණ්ඩලය මැදිවන සේ වගා මාධ්‍ය බෝලයක් ලෙස සකස් කර එල්ලීමට හැකි පරිදි සකස් කරනුයේ,
(1) කොකිඩාටා වගා ක්‍රමය (2) බොන්සායි වගා ක්‍රමය
(3) ක්ෂුද්‍රරූපී උද්‍යාන (4) සයිවිකලා මණ්ඩප

12. චතුර්පියන් බද්ධයේ දී ඵල නොදරන පලතුරු ශාකය හඳුන්වන්නේ,
(1) අනුජය ලෙස (2) අනු ඵල ලෙස (3) ග්‍රාහකයා ලෙස (4) ආධාරක ලෙස

13. පාංශු පුනරුත්ථාපන ශාක වර්ගයකි,

(1) වට්ටක්කා (2) පියුරේරියා (3) ගොටුකොළ (4) අඬනහිරියා

14. මුදල් ලේඛනයක තිබිය යුතු වැදගත් විස්තරයක් වන්නේ,

(1) ශ්‍රමික සංඛ්‍යාව (2) ව්‍යාපාර භූමිය පිළිබඳ තොරතුරු

(3) ගොඩනැගිලිවල ඇස්තමේන්තු (4) මුදල් ගෙවීම්

15. කුඩා පරිමාණ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා වැදගත් වන ආයතනයකි,

(1) කාර්මික සංවර්ධන මණ්ඩලය (2) මූල්‍ය ආයතනය

(3) නගර සභාව (4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

● **වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(ඉන්ද්‍රිය ගෝචරබව / උත්තේජනය / උමාවිරස / පැණිරස / ජනගහණ වර්ධනය / SLS / ISO)

16. ආහාර විවිධාංගීකරණය කිරීමෙන් ..... වෙනස්කර පාරිභෝගිකයා වෙත ලබාදිය හැකි ය.

17. ..... යනු ආහාරයක් දුටු පමණින් එය ලබාගැනීමට පෙලඹවීමයි.

18. ..... දිවෙහි ඕනෑ ම ස්ථානයකට සංවේදනය වේ.

19. ..... නිසා ආහාරවලට දිනෙන් දින පවතින ඉල්ලුම ඉහළ යයි.

20. ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධානය ..... සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ..... මගින් ද නිර්දේශ කරනු ලබයි.

(ලකුණු 1 x 20 = 20)

II කොටස

● **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්නවලින් දෙකක් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. (1) සීමිත ඉඩකඩක් සඳහා සුදුසු වගා ක්‍රම 2 ක් ලියන්න.
(2) ආහාර නිෂ්පාදනයක තිබිය යුතු ප්‍රමිති හා පිරිවිතර 2 ක් ලියන්න.
(3) කොළ පැහැති ආහාර ගැනීමේ ප්‍රයෝජන 2 ක් ලියන්න.
(4) ව්‍යවසායකයින් කුඩා ව්‍යාපාරවලට නැඹුරුවීමට හේතු 2 ක් ලියන්න.
(5) කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට වැදගත් වන ආයතන 2 ක් ලියන්න. (ල. 5 x 2 = 10)

02. (1) පරිසරයට හානි සිදුවන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් 3 ක් ලියන්න. (ල. 03)
(2) ආහාර ආශ්‍රිත කර්මාන්තවල පැවැත්ම කෙරෙහි බලපාන සාධක 3 ක් ලියන්න. (ල. 03)
(3) ආහාර නිෂ්පාදනය කරන ස්ථානයේ පිරිසිදුකම පවත්වා ගැනීමට සිදුකළ යුතු දෑ 4 ක් ලියන්න. (ල. 04)

03. (1) ආහාරයේ සෞඛ්‍යාරක්ෂිත බව නොමැති වන අවස්ථා 3 ක් ලියන්න. (ල. 03)
(2) ආහාර විවිධාංගීකරණය කිරීමේ වැදගත්කම් 3 ක් ලියන්න. (ල. 03)
(3) ආහාර ලේබලයක අඩංගු විය යුතු කරුණු 4 ක් ලියන්න. (ල. 04)

04. (1) විසිතුරු පැළ ප්‍රදර්ශනාත්මක ව විවිධ හැඩතල අනුව සකස් කිරීම සඳහා උදාහරණ 3 ක් ලියන්න. (ල. 03)
(2) ව්‍යවසායකයකු වීමේ අරමුණු 3 ක් ලියන්න. (ල. 03)
(3) නවෝත්පාදන සිදුකළ හැකි ආකාර 2 ක් ලියන්න. (ල. 04)

05. (1) පාංශු පාරිසරික තත්ත්ව දියුණු කිරීමට හරිත තාක්ෂණික ක්‍රම 3 ක් ලියන්න. (ල. 03)
(2) ආහාර ඇසුරුමේ දී සුදුසු ඇසුරුමක් තෝරාගැනීමේ වාසි 3 ක් ලියන්න. (ල. 03)
(3) කුඩා ව්‍යාපාර අරඹන ව්‍යවසායකයන්ට ව්‍යාපාර සාර්ථක කර ගැනීමට බලපාන වාසිදායක ක්‍රියාකාරකම් 4 ක් ලියන්න. (ල. 04)

● **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**

2024 - අවසාන වාර පරීක්ෂණය - ප්‍රායෝගික තාක්ෂණ කුසලතා - 09 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

I කොටස

(01)	1	(02)	4	(03)	4	(04)	1	(05)	2	(06)	3	(07)	3	(08)	1
(09)	1	(10)	2	(11)	1	(12)	3	(13)	4	(14)	4	(15)	4		

(16) ඉන්ද්‍රීය ගෝචරබව (17) උත්තේජනය (18) උමාවිරස (19) ජනගහන වර්ධනය නිසා

(20) SLS / ISO (ලකුණු 1 x 20 = 20)

II කොටස - පිළිතුරු

01. (1) වගා කුලුනු / වගා කූඩ / වගා ඉනිමං / වගා පිරමීඩ / වගා රාක්ක
(2) පාරිභෝගිකයාට සෞඛ්‍යාරක්ෂිත ආහාරයක් ලබාදීම.
පාරිභෝගිකයාට ආහාර සැපයුම්දාමය පිළිබඳව විශ්වාසය තහවුරු කිරීම.
ගුණාත්මක හා සෞඛ්‍ය සම්පන්න ආහාර තෝරාගැනීම පහසු කිරීම.
ආහාරවල ගුණාත්මක බව හා සෞඛ්‍යාරක්ෂිත බව සන්නිවේදනය කිරීම.
(3) පිළිකා වැලඳීමේ අවදානම අඩුකිරීම.
ප්‍රතිශක්තීකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
නිරෝගී දේහ ක්‍රියාවලි පවත්වා ගැනීම.
(4) පහසුවෙන් ආරම්භ කළ හැකි වීම. / නීතිරීති ලිහිල් වීම.
(5) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය / ප්‍රාදේශීය සභාව

02. (1) වන ආවරණ ඉවත් කිරීම.
එකම භූමියේ නොකඩවා භෝග වගා කිරීම.
රසායනික පොහොර හා පිළිබෝධ නාශක භාවිත කිරීම.
ජලය අපතේ යාම.
ජෛව ස්කන්ධ නිසා පරිසරයට සිදුවන හානි
(2) ජනගහන වර්ධනය / ගෝලීයකරණය / වෙළෙඳ ගිවිසුම / සුපිරි වෙළෙඳසල් ප්‍රචලිත වීම
(3) නිෂ්පාදන ක්‍රියාවලිය පාලනය කිරීම. / පුද්ගල සනීපාරක්ෂාව / නිෂ්පාදන උපකරණවල ප්‍රමිතිය / ස්ථානයේ පිරිසිදුකම

03. (1) ක්ෂුද්‍රජීවී ගහණය වැඩිවීම.
අහිතකර විෂ ද්‍රව්‍ය ආහාරයේ අඩංගු වීම. (උදා- ඇෆ්ලොටොක්සින්)
කර්මාන්තවලින් පිටකරන විෂ දූලක ආහාරය සමග මිශ්‍ර වීම.
නුසුදුසු ද්‍රව්‍ය ආහාරයට මුසුවීම. (උදා - ලිහිසි ද්‍රව්‍ය, ඉන්ධන)
(2) පාරිභෝගික රසඥතාවය අනුව නිෂ්පාදන මිලට ගත හැකි වීම.
බොහෝ ආහාර කල් තබාගත හැකි වීම.
විවිධ පුද්ගල අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි අමුද්‍රව්‍ය යොදාගත හැකි වීම.
(3) මිල / ශුද්ධ බර / අඩංගු ද්‍රව්‍ය / නිෂ්පාදන දිනය / කල් ඉකුත්වීමේ දිනය / ගබඩා කළ යුතු අන්දම

04. (1) ක්ෂුද්‍රරූපි උද්‍යාන / සිඟිති උද්‍යාන / සජීවී කලා නිර්මාණ / බොන්සායි / කොකිඩාමා
(2) නව නිර්මාණ එළිදැක්වීමට / පවුලේ ආදායම ඉහළ නැංවීමට / රටේ ආර්ථික සංවර්ධනයට / රැකියා උත්පාදනය කිරීමට / ජීවන මට්ටම උසස් කිරීමට
(3) යම්කිසි අවශ්‍යතාවක් ඉටුකිරීම සඳහා අලුත් නිමැවුමක් හඳුන්වා දීම.
පවතින භාණ්ඩයකට නවාංගයන් එකතු කිරීම.

05. (1) භෝග වගාවේදී කොම්පෝස්ට්, කොළ පොහොර ගොම ඇතුළු සත්ත්ව අපද්‍රව්‍ය ආදී කාබනික පොහොර පමණක් යෙදීම.
කාබනික ශාක පෝෂක ඒකක වගා භූමියේ පිහිටුවීම.
කාබනික දියර පොහොර යෙදීම.
(2) ඇසුරුම පරිසර හිතකාමී වීම.
පාරිභෝගික ආකර්ෂණය තිබිය යුතු වීම.
ආහාරය සමග ප්‍රතික්‍රියා නොකිරීම.
(3) ක්‍රමවත් ව්‍යාපාර සැලසුමක් පවත්වාගෙනයාම.
යටිතල පහසුකම් හොඳින් සැපයෙන ස්ථානයක ව්‍යාපාරය ගොඩනැගීම.
නව දැනුම ලබාගැනීම.
ව්‍යාපාර සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය මාර්ග හඳුනාගැනීම.

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**